IWWRMP

# පුරප්පාඩු

# ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

## වාරිමාර්ග අමාත්‍යාංශය

ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) ලෝක බැංකු ආධාර මත වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන 2025 ඔක්තෝබර් මාසය වන විට අවසන් කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතියකි.

මෙම ව්‍යාපෘතියේ කොළඹ පිහිටි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පහත දැක්වෙන තනතුරු සඳහා 2019.03.15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට අනුව පූර්ණ කාලීනව "කොන්ත්‍රාත් පදනම" යටතේ රාජ්‍ය සේවයේ / පළාත් පාලන ආයතන ද ඇතුළුව පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජයේ සම්පූර්ණ හිමිකාරිත්වය සහිත සමාගම්වල ස්ථිර සේවයේ යෙදෙන නිලධාරීන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 01/2019 චක්‍රලේඛයේ 2.3.3, (අ) ඡේදය සහ 2.3.3, (ආ) ඡේදය සහ රජයේ බඳවාගැනීම් පටිපාටියට අනුකූලව බඳවාගැනීම් සිදු කරනු ඇත.**

මෙම තනතුරු සඳහා ගෙවනු ලබන වැටුප් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයෙහි 03 වැනි වගුවේ 03 වැනි තීරයේ දක්වා තිබේ.

අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 62ට වඩා අඩු විය යුතු අතර, ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය මෙන්ම රජයේ රෙගුලාසි පිළිබඳ සුහුරු බව සහ පරිගණක පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය පූර්ව සුදුසුකම් වන්නේය. විදේශ ආධාර සහිත ශ්‍රී ලංකා ව්‍යාපෘතියක සේවය කර පළපුරුද්දක් ලබා තිබීම අමතර වාසියක් වනු ඇත.

| අංකය | PS ප්‍රභේදය | තනතුර | තනතුරු සංඛ්‍යාව | චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 01 | PS 4A | ඉංජිනේරු | 1 | එම් එස් ඩී චක්‍රලේඛ 01/2019 |
| 02 | PS 4B | ඉංජිනේරු | 3 | |
| 03 | PS 5 | ගණකාධිකරණ නිලධාරී | 1 | |
| 04 | PS 5 | ජල කළමනාකරණ පද්ධති තාක්ෂණවේදී | 1 | |
| 05 | PS 6A | සංවර්ධන නිලධාරී | 1 | |
| 06 | | කළමනාකරණ සහකාර | 2 | 06-2006 රාජ්‍ය සේවා කොමිසම |
| 07 | | රියැදුරු | 3 | |

අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සහ ඔබ පිළිබඳ තොරතුරු දැනගත හැකි ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ද ඇතුළත් අයදුම්පත් **2024 අප්‍රේල් 07** වැනි දිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය. ඊට අමතර වශයෙන් එම අයදුම්පතම **ao.iwwrmp@gmail.com** ලිපිනයට විෂය පේළියේ ඉල්ලුම් කරන ලද තනතුර සඳහන් කොට විද්‍යුත් ලිපිනයට එවන ලෙසට ද අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

සියලුම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)**
**2 වැනි මහල, මහවැලි කේන්ද්‍රය,**
**අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.**

**ටෙලි අංක : 011-2691163** **වෙබ් : www.iwwrmp.lk**

තෝරාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ඇත. කුමන ආකාරයේ හෝ බාහිර බලපෑමක් කිරීම නුසුදුසු කමක් වන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය.**
**25.03.2024**